**සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ (සංරචක - 1 පළාත් කොටස) - 2023**

**----------------------------------------------------------------------------------------**

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ (සංරචක - 1 පළාත් කොටස) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 ජූලි 25 දිනැති 6228 එල්කේ අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර ගිවිසුම්ගත ණය ගිවිසුමේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා කාල සීමාව

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය පළාත් සම්බන්ධීකරණ අමාත්‍යාංශය වන අතර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ නවය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 15,505කට සමාන එ.ජ.ඩො. මිලියන 100 ක් වන අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැයම ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 අගෝස්තු 30 දින ආරම්භ කර තිබුණු අතර 2024 ජූනි 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධව පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| පරීක්ෂණයට ලක්වූ වයඹ පළාතෙහි පාසල් 04 ක 10 හා 11 ශ්‍රේණිවල සිසුන්ගේ ඉංග්‍රීසි හා ගණිත යන විෂයයන් දෙකට 2022 හා 2023 වර්ෂවලදී සිසුන් ලබාගත් ලකුණුවල සමාන්‍ය සියයට 41කටත් අඩු මට්ටමක පවතින බැවින් ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන පරිදි පළමු වියපැහැදම් සබැඳි දර්ශක දෙක කරා ලගා වීමට නොහැකි වී තිබුණි. | විශේෂයෙන් ඉංග්‍රීසි වැනි භාෂාවක් දියුණු කර ගැනීමට දරුවන්ට මෙවැනි ඉංග්‍රීසි ඒකක මනා රුකුලක් වනු ඇත. නමුත් විභාග වලින් එම හැකියාව මැනිය නොහැකි බවත්, ගණිත ප්‍රායෝගික දැනුමද එවැනිම තත්ත්වයක පවතින බවත් කාරුණිකව දන්වා සිටිමි. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියා කළ යුතුය. |

### 2.2 මතභේදාත්මක ස්වභාවයේ ගැටළු

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේදී දකුණු පළාතේ විෂය අධ්‍යක්ෂවරුන් සඳහා රු.මි.6 ක් වැයකර ලැප්ටොප් පරිගණක මිලදී ගෙන තිබුණි. එසේ වුවද ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම ලැප්ටොප් පරිගණක සෘජුවම භාවිතා නොකරන බව නිරීක්ෂණය විය. | බෙදා හරින ලද පරිගණක හා ඉලෙක්ට්‍රොනික උපකරණ ගණිත විද්‍යාගාර, ඉංග්‍රීසි සහ අනෙකුත් විෂයය ක්ෂේත්‍රයන්හි භාවිතා කිරීම DLI අනුව සිදුකර ඇත. | දරනු ලබන වියදම් ව්‍යාපෘති DLI වලට අනුකූල විය යුතුය |
| (ආ) | පොදු අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මක බව ඉහල නැංවීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු හා ඉලක්ක වුවද වයඹ පළාතේ කෘෂිකර්ම උපකරණ, ක්‍රීඩා උපකරණ, ගෘහ විද්‍යා උපකරණ හා සෞන්දර්ය උපකරණ මිලදී ගැනීම සඳහා 2020 සිට 2023 වර්ෂය දක්වා රු.මිලියන 31 ක මුදලක් වැය කර තිබුණි. | පාසල්වල පුස්තකාල, කෘෂිකාර්මික ඒකක, ක්‍රීඩා ඒකක, ගෘහ විද්‍යා ඒකක සඳහා පහසුකම් සැලසීම මගින් සමස්ථ පාසල් තත්ත්ව සහතිකය සහ පාසලේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම ඉලක්ක කර ඇත. මේ සඳහා ව්‍යාපෘතියෙන් හා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් මෙන්ම ප්‍රධාන ලේකම්ගේද අනුමැතිය ලැබී ඇත. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන 2023 ඔක්තෝම්බර් 25 දින මන්නාරම කලාප අධ්‍යාපන කාර්යාලය වෙත භාරදුන් ක්‍රියාකාරී මේස කට්ටල 10ක් සහ 2024 මාර්තු 22 දින ලබාදුන් ගුරු පුටු 121ක් තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූල නොවීම හා විවිධ අඩුපාඩු හේතුවෙන් අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා නොකර කලාප අධ්‍යාපන කාර්යාලයේ ගබඩා කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූල නොවූ ගෘහ භාණ්ඩ භාරගැනීම නොකළ යුතු අතර එම ගෘහ භාණ්ඩ තාක්ෂණික පිරිවිතරයන්ට අනුව නැවත සකස් කරවා ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ඈ) | 2023 දෙසැම්බර් 12 වන දින ජ/පුත්තූර් සෝමස්කාන්ත විද්‍යාලයට හා ජේ/උරුම්පිරායි සයිවටමිල් විද්‍යාලයට 25 බැගින් ලබාදී ඇති ශිෂ්‍යයින් සඳහා වූ ලැප්ටොප් පරිගණක 50ක් 2024 ජුනි 11 දින දක්වා භාවිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඉ) | ව්‍යාපෘතියේ වියපැහැදම් සබැඳි දර්ශක (DLI) තුළින් ප්‍රධාන වශයෙන් ආවරණය කරනු ලබන ප්‍රධානතම ප්‍රතිලාභීන් කණ්ඩායම පාසල් සිසුන් හා එහි සෘජු ප්‍රතිලාභීන් වන අධ්‍යයන සහ කළමනාකරණ කාර්යය මණ්ඩලය වුවද ඊට පරිබාහිරව වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා කලාප කාර්යාල මගින් 2019 සිට 2022 දක්වා රු.මිලියන 54 ක පරිගණක, Tab, මුද්‍රණ යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර සහ ලී බඩු මිල දී ගැනිම සඳහා වියදම් කර තිබුණි. | පාසල් ගුරුවරුන්ගේ වැටුප් ගෙවීම් ක්‍රමාණුකූලව කර ගැනීම සඳහා මෙම මුද්‍රණ යන්ත්‍ර ලබාදී ඇති අතර එ මගින් ගුරුවරුන් අභිප්‍රේරණය, ඉගෙනුම් ක්‍රියාවලියේ ඵලදායි බව හා කාර්යක්ෂමව සිදුවන බව දන්වා ඇත.<br><br>ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක, ලී බඩු, ලැප්ටොප් යන්ත්‍ර සිසුන්ගේ හා ගුරුවරුන්ගේ අධ්‍යාපන සංවර්ධනය හා ධාරිතා සංවර්ධනය සැලසුම් කර කාර්යක්ෂම කර ගැනීමටත් නිසි පරිදි කළමණාකරණය, නියාමනය හා අධීක්ෂණය ක්‍රියාවලිය ශක්තිමත් කිරිමටත් පහසුකම් සලසා ගැනීම සඳහා යොදවා ගෙන ඇත. | ව්‍යාපෘතියේ අරමුදල් වියපැහැදම් සබැඳි දර්ශක (DLI) හා අනුගත විය යුතුය. |
| (ඊ) | ගුරු නිවාස සහ විදුහල්පති නිල නිවාස ප්‍රතිසංස්කරණය සහ අළුත්වැඩියාවන් සඳහා වියපැහැදම් සබැඳි දර්ශකයකින් ප්‍රතිපාදන වෙන්කර නොතිබියදී වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා කලාප කාර්යාල මගින් රු.මිලියන 24ක් ඒ සඳහා ව්‍යාපෘති අරමුදලින් දරා තිබුණි. | සාධාරණීකරණ වාර්තා අනුව ව්‍යාපෘතිය හා අනෙකුත් සියළු බලධාරින් වෙතින් මේ සඳහා අනුමැතින් ලැබී ඇති බව දන්වා ඇත. | වියපැහැදම් සබැඳි දර්ශකය අනුව ප්‍රතිපාදන වෙන්කර ගත යුතු අතර ප්‍රතිපාදන නොමැතිව වියදම් නොදැරිය යුතුය. |

## 2.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | <u>වාරියපොළ ඉංග්‍රීසි සහ ගණිත සංවර්ධන මධ්‍යස්ථාන</u> | | |
| | (i) 2023 ජුලි 07 දින සිට 2023 සැප්තැම්බර් 27 දින දක්වා ගණිත වැඩසටහන් 19 ක් පවත්වා තිබුණද කිසිදු ගණිත උපකරණයක් මෙම මධ්‍යස්ථානට සපයා නොතිබුණ අතර ඉහළ මහලේ දකුණුපස දේශන ශාලාව සහ පහළ මාලයේ ඉංග්‍රීසි වැඩසටහන් සඳහා වෙන්කර ඇති කොටසට ආසන පහසුකම් ද සපයා නොතිබුණි. | මේ වන විට එම ස්ථානයට පත් කර ඇති නිලධාරියාගේ අවශ්‍යතා ලේඛන රැගෙන 2024 GEMP සැලැස්මට එම භාණ්ඩ මිල දී ගැනීම ඇතුළත් කර ඇති බව දන්වා ඇත. | වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය උපකරණ හා අවශ්‍ය ආසන පහසුකම් සැපයිය යුතුය. |
| | (ii) කැට ගල් අතුරා භූමිය සැකසීම සහ ජල ටැංකි රඳවනය සැකසීම සඳහා රු.මිලියන 4.6කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කැට ගල් ඇල්ලීමේදී වැසි ජලය නිසි ලෙස ගලායන පරිදි එය සිදු කර නොතිබුණ අතර ගොඩනැගිල්ල පිටුපස භූමිය වැසි ජලය ගලායන පරිදි සකස්කර නොතිබුණි. | අධීක්ෂණ කටයුතු ඉංජිනේරු දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබයි. මේ සම්බන්ධයෙන් පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. | කැට ගල් ප්‍රමිතියට නොඇල්ලීම සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු කළ ඉංජිනේරු වගකිව යුතු අතර වැසි ජලය ගලායන පරිදි භූමිය සකස් කළ යුතුය. |
| (ආ) | රළපනාව කනිෂ්ඨ විද්‍යාලයට අඩි 30*25 පුස්තකාලයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 9.3කට ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන තිබුණ අතර ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන්කළ යුතු දිනය 2023 මැයි 02 විය. එසේ වුවද 2023 ඔක්තෝම්බර් 11 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව 2023 මැයි 02 දින වැඩ අවසන් කළයුතු වූ අතර, ඉන්පසු 2023 මැයි 24 දින දක්වා දින 22 ක කල්දිගුවක් ලබා දී ඇත. 2023 මැයි 25 දිනෙන් පසු උපරිම සීමාව දක්වා ප්‍රමාද ගාස්තු අයකරගන්නා බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අංක ව/අධ්‍යා/පගි/18/විග/22/2022 හා 2023 දෙසැම්බර් 30 දිනැති ලිපියෙන් දන්වා ඇති බව දන්වමි. | එකඟ වූ කාලය තුළ වැඩ අවසන් කළ යුතු අතර ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් පසුවිපරම් කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති පරමාර්ථවලින් බැහැරව පම්බල අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය සඳහා ජල සැපයුම් පද්ධතියක් සහ ආරක්ෂක කුටියක් ඉදිකිරීම සඳහා රු. මිලියන 7.2ක් ව්‍යාපෘති මුදලින් වියදම් කර තිබුණි. | GEM ව්‍යාපෘතියේ DLI 1, 2 මෙන්ම ඉතිරි සියලුම DLI වලටත් අදාල විෂය සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනයෙහි ලා මෙම මධ්‍යස්ථානය මහත් පිටුවහලක් වනු ඇති නිසා එම DLI වලට අදාලව මෙම මධ්‍යස්ථානය සංවර්ධනය කරන ලදි. | දරන ලද වියදම් ව්‍යාපෘති DLI වලට අනුකූල විය යුතුය. |

## 3. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති ඇගයුම් ලේඛනයට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා වැය කිරීමට ඇති මුළු මුදල රු. මිලියන 26,924 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 83.12 කි. කෙසේ වෙතත් 2023 දෙසැම්බර් 31 දිනට වැය කර තිබුණේ රුපියල් මිලියන 8,697 ක් පමණි. ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය සියයට 32.30කි. | අදහස් දක්වා නොමැත. | ක්‍රියාත්මක කරන ආයතන විසින් ප්‍රමාදයන් ආවරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු ය. |

## 4. පද්ධති හා පාලනයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය සඳහා වෙන වෙනම මුදල් ලැබී තිබුණද මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අවශ්‍ය මූලික පොත්පත් සහ ගිණුම් නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අවශ්‍ය මූලික ගිණුම් පොත් නිසි පරිදි පවත්වාගෙන යන ලෙස පළාත් නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | පොත්පත් සහ ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | බෙදා හැරීමෙන් පසු උපකරණ භාවිතය පිළිබඳ පසු විපරම් කිරීමට අපොහොසත් වී තිබුණි. | උපකරණ සම්පූර්ණයෙන් භාවිතා කරන ලෙස සියලුම විදුහල්පතිවරුන්ට දැනුම් දී ඇති අතර ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල හරහා අධීක්ෂණ කටයුතු සිදු කිරීමට උපදෙස් නිකුත් කරන ලදී. | පසු විපරම් ක්‍රියාපටිපාටි වගකිව යුතු පාර්ශවයන් විසින් නියමිත වේලාවට සිදු කළ යුතුය. |
| (ඇ) | ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාවේ ඇමුණුම 01 හි 19 ඡේදය ප්‍රකාරව ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනය, සෞඛ්‍ය අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ ප්‍රාදේශීය අධ්‍යාපන ආයතනයන්හි අභ්‍යන්තර ඒකක මඟින් සිදුකිරීමට බලාපොරොත්තු වුවද, ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණන කටයුතු එසේ සිදු කර නොතිබුණි. | පළාත් පාලන ආයතනවලට උපදෙස් දී තිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතුය. |